# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 33/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 07/01/2024 පැය 1450

## මාධ්‍ය නිවේදනය

### පාපන්දු ක්‍රීඩා පුහුණු කඳවුරක් පැවැත්වීම හා ක්‍රීඩා උපකරණ බෙදාදීමේ වැඩමුළුව - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

අපරාධ හා මත්ද්‍රව්‍ය වලට තරුණයින් ඇබ්බැහිවීම වළක්වා ගැනීම, පරිගණක හා ජංගම දුරකථන වලට ඇබ්බැහි වූ තරුණ කොටස් ඉන් මුදවා ගැනීම, විනයගරුක නිරෝගීමත් තරුණ පරපුරක් බිහිකිරීම සහ ජාතීන් අතර සුහදතාවයක් ඇති කිරීම තුළින් ශක්තිමත් සමාජයක් බිහිකිරීම යන අරමුණු මත පොලිස් ක්‍රීඩා කොට්ඨාසය මඟින් ශ්‍රී ලංකාවේ පාපන්දු ක්‍රීඩාව ඉහළ නැංවීම සඳහා පාපන්දු වැඩමුළු මාලාවක් නොමිලේ ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව එහි 39 වන වැඩමුළුව වැඩබලන පොලිස්පතිතුමාගේ "යුක්තිය" මෙහෙයුමට සමගාමීව **2024.01.06 වන දින මාලිගාවත්ත, පී.ඩී සිරිසේන ක්‍රීඩාංගණයේදී ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ** සහභාගීත්වයෙන් පැවැත්විණි.

කොළඹ මහනගර සභා බල ප්‍රදේශය තුල ජීවත්වන දරුවන් 200 ක පමණ සහභාගිත්වයෙන් මෙම පාපන්දු වැඩමුළුව පවත්වන ලද අතර, එහිදී ප්‍රදර්ශන පාපන්දු තරගයක් පවත්වා අනතුරුව දරුවන් හට පාසල් බෑග් ඇතුළු ක්‍රීඩා උපකරණ බෙදා දීමක් ගරු අමාත්‍යතුමා හා වැඩබලන පොලිස්පතිතුමා අතින් සිදුකරන ලදී.

තවද මෙම වැඩමුළුවට සමගාමීව ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයින් වන ප්‍රගීත් චාමර සිල්වා සහ කුසල් ජනිත් පෙරේරා ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර සඳහා හා නුවන් ප්‍රදීප් රොෂාන් ප්‍රනාන්දු, නදීජ අශේන් බංඩාර සහ රැල්ෆ් ප්‍රියමාල් පෙරේරා යන ක්‍රීඩකයින් පොලිස් පරීක්ෂක තනතුර සඳහා බඳවා ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම පළමු පෙළ ක්‍රිකට් තරඟවලට සහභාගි වී ඇති විශිෂ්ඨ දක්ෂතා දක්වන ලද නලීන් ප්‍රියදර්ශන, විශාඩ් රන්දික ද සිල්වා, හේෂාන් ධනුෂ්ක ප්‍රනාන්දු, සුපුන්

මධුසංඛ සහ නදීර මධුසංඛ යන ක්‍රීඩකයින් උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා බඳවා ගෙන ඇති අතර ඒ සම්බන්ධව ශ්‍රී ලංකා පොලිසිය හා ජාතික තරුණ සේවා සභාව අතර අවබෝධතා ගිවිසුමක් මහජන ආරක්ෂක අමාත්‍යතුමන් හා වැඩබලන පොලිස්පතිතුමන් විසින් අත්සන් කිරීම සිදු කරන ලදි.

මෙම අවස්ථාවට මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක, ජාතික තරුණ සේවා සභාපති පසිඳු ගුණරත්න, ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ හිටපු නායකයෙකු වන ජ්‍යෙෂ්ඨ ක්‍රීඩක සනත් ජයසූරිය, ශ්‍රී ලංකා ජාතික පාපන්දු කණ්ඩායමේ වෛද්‍ය බුද්ධික ලොකුගමගේ, කොළඹ මහ නගර සභාවේ ක්‍රීඩා අධ්‍යක්ෂ කේ.කේ. පත්මසිරි, ජ්‍යෙෂ්ඨ අධීක්ෂණ ක්‍රීඩා නිලධාරී චන්දන පෙරේරා සහ අතිරේක මත්ද්‍රව්‍ය උපදේශක ලලිත් රෝහණ යන මහත්වරුන් ඇතුළු පිරිසක් සහභාගී විය.